# ඇලිගේටර් වල් පැළෑටිය

*Alternanthera philoxeroides*

AGRICULTURE VICTORIA

## ඇලිගේටර් වල් පැළෑටිය (ALLIGATOR WEED) යනු කුමක්ද?

ඇලිගේටර් වල් පැළෑටිය යනු ලොව ඇති භායානකම වල්පැළෑටියකි. එය භූමියේ සහ ජලයේ යන ස්ථාන දෙකෙහිම අන්තරාය ඇති කරයි.

සෑම ඇලිගේටර් වල් පැළෑටියක්ම ප්‍රාන්තයෙන් ඉවත් කර දැමීම සම්බන්ධ වගකීම ඇත්තේ වික්ටෝරියානු රජයටය.



**ඡායාරූපය: ඇලිගේටර් වල් පැළෑටියේ මලක සමීප ඡායාරූපයක්**

## ඇලිගේටර් වල් පැළෑටිය ඔබට ආහාරයට ගැනීමට හෝ ගෙවත්තේ සිටුවීමට යෝග්‍ය නැත.

ඇලිගේටර් වල් පැළෑටිය බොහෝ අවස්ථාවල මුකුණුවැන්න (Mukunuwenna) (*Alternanthera sessilis*) ලෙස වැරදි ආකාරයට හඳුනා ගන්නා අතර කොළ එළවළුවක් ලෙස භාවිතා කරයි. ඇලිගේටර් වල් පැළෑටිය යනු ඔබට ගෙවත්තේ වගා කිරීමට හෝ ආහාරයට ගැනීමට අවශ්‍ය නොමැති ශාකයකි.

මෙම වල් පැළෑටිය ඉතා වේගයෙන් පැතිරිය හැකි අතර ඔබගේ ගෙවත්තේ වගා කරන වෙනත් ශාඛ, පළතුරු සහ එළවළු සමඟ තරඟ කල හැකි අතර ගෙවතු වගාවල ඵලදාව සහ ගුණාත්මක බව අඩු වීම සිදුවේ.

ඇලිගේටර් වල් පැළෑටිය මගින් භූමියෙන් බැර ලෝහ උරාගත හැකි අතර ආහාරයට ගැනීමට ආරක්ෂාකාරී නොවේ.

ඇලිගේටර් වල් පැළෑටිය මදුරුවන් වැනි කෘමි විශේෂ හට ජීවත්වීමට සුදුසු පරිසරයක් ඇති කරන අතර ඔබගේ ගෙවත්තේ ඒවා පාලනය කිරීම අපහසුවේ.

## ඇලිගේටර් වල් පැළෑටිය මගින් අපගේ පරිසරයට හානි පමුණුවයි

ඇලිගේටර් වල් පැළෑටිය ජල මාර්ග, ගෙවතු, තණ පිට්ටනි සහ සතුන් සඳහා වන තණ බිම් වසා පැතිරිය හැකිය.

එය වේගයෙන් සහ පහසුවෙන් පැතිරිය හැකි අතර මැරීමට දුෂ්කරවේ.

මෙම පැළෑටිය ප්ලැටිපුස් වැනි දේශීය ඕස්ට්‍රේලියානු සතුන් හට හානිදායක විය හැක්කේ ඒ මගින් ජල මාර්ග අවහිර කර ඔවුන් හට ලැබෙන ආහාර අඩු කිරීම හේතුවෙනි.

මිනිසුන් විසින් සතුටින් සිදු කරන මාළු ඇල්ලීම, කයාකින් සහ වෝටර් ස්කීන් ආදී ක්‍රියාකාරකම් කිරීම මේ මගින් නැවැත්විය හැකිය.

ගංඟා, විල් සහ ජල ප්‍රවාහ තුල මේ මගින් ගොවීන්ගේ වියදම වැඩි කර ආහාරවල වියදම වැඩි කල හැක.

## ඇලිගේටර් වල් පැළෑටිය හඳුනා ගන්නා ආකාරය



**ඡායාරූපය: ඇලිගේටර් වල් පැළෑටියේ මල සහ පත්‍ර පෙන්වන ඡායාරූපයක්**

ඇලිගේටර් වල් පැළෑටිය භූමියේ සහ ජලයේ වර්ධනය විය හැකිය. දීප්තිමත් කොළ පැහැති පත්‍ර දෙක බැගින් කඳෙහි එකට වැඩේ.

කඳ හිස්ය.

මල් සෑදෙන්නේ කඳෙහි වන අතර සුදු පැහැති අතර බෝලයක හැඩය ගනී.

## ඇලිගේටර් වල් පැළෑටිය සම්බන්ධයෙන් අපට දැනුම් දීම මගින්උපකාර කරන්න.

වික්ටෝරියානු පරාන්තයෙන් සියළුම ඇලිගේටර් වල් පැළෑටි ඉවත්කර අපගේ වටිනා පරිසරය සහ කෘෂිකාර්මික කර්මාන්ත ආරක්ෂා කිරීම සඳහා වික්ටෝරියානු රජයේ ප්‍රයත්නයට උපකාර කරන්න.

ඔබගේ ගෙවත්තේ ඇලිගේටර් වල් පැළෑටිය ඇති නම් හෝ ඔබ එය වෙනත් ස්ථානයක වැවෙන බව දුටුවේ නම්, කරුණාකර අප වෙත දැනුම් දෙන්න, ඒ මගින් ඒවා ව්‍යාප්තවීම වැළැක්වීම සඳහා නිසි ආකාරයට ඉවත් කල හැකිය.

මෙය වික්ටෝරියානු කෘෂිකර්මාන්තය (Agriculture Victoria) මගින් නොමිළේ ලබා දෙන සේවාවකි.

වික්ටෝරියානු කෘෂිකර්මාන්තය (Agriculture Victoria) සමඟ මේ ආකාරයට සම්බන්ධ වන්න:

- දුරකථන අංක 136 186 ඔස්සේ අපගේ පාරිභෝගික සේවා මධ්‍යස්ථානය ඇමතීම, හෝ
- weed.spotters@agriculture.vic.gov.au වෙත ඊමේල් පණිවුඩයක් යැවීම.

මෙම වල් පැළෑටිය ඔබ විසින්ම පාලනය කිරීමට හෝ බැහැර කිරීමට උත්සාහ කිරීම මගින් එය ව්‍යාප්ත විය හැකි බැවින් එසේ උත්සාහ නොකරන්න.

## වික්ටෝරියා ප්‍රාන්තය ආක්‍රමණශීලී වල් පැළෑටි වලින් ආරක්ෂා කර ගැනීමට ඔබ විසින් ලබාදෙන උපකාරයට වික්ටෝරියානු කෘෂිකර්මාන්තය ස්තුතිවන්තවේ.



**ඡායාරූපය: ඇලිගේටර් වල් පැළෑටියේ මල සහ පත්‍ර පෙන්වන ඡායාරූපයක්**

### ප්‍රවේශ විය හැකි බව

වික්ටෝරියානු කෘෂිකර්මාන්තය (Agriculture Victoria) සම්බන්ධ වැඩිදුර විස්තර සඳහා www.agriculture.vic.gov.au යන වෙබ් අඩවිය වෙත පිවිසෙන්න, නැතිනම්, දුරකථන අංක 136 186 ඔස්සේ පාරිභෝගික සේවා මධ්‍යස්ථානය අමතන්න

AGRICULTURE VICTORIA